# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2019 නොවැම්බර් මස 15 වන දින

## II වන කොටස

## අතිරේකය

## (2019.11.20 දින නිකුත් කරන ලදී)

# ආර්ථික සේවා ගාස්තු (සංශෝධන)

**2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

මුදල් අමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 17.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

***නීතිය බලපෑමේ ප්‍රකාශය***

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 2 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ ඇතැම් අයිතම හෝ භාණ්ඩ ආනයනය මත අදාළ වන සේවා ගාස්තු ප්‍රතිශෝධනය කිරීම වේ.

***3 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධානවලට ආනුෂංගික වේ.

***4 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධානවලට ආනුෂංගික වේ.

***5 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ "බෙදාහරින්නා" සහ "දේශීය ආදායම් පනත" යන යෙදුම්වල අර්ථ නිරූපණ සංශෝධනය කිරීම වේ.

## ආර්ථික සේවා ගාස්තු (සංශෝධන)

එල්.ඩී.— ඕ. 16/2019

### 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

**1.** (1) මේ පනත 2019 අංක  දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) 3 වන, 4 වන සහ 5 වන වගන්තිවල විධිවිධාන 2018 අප්‍රේල් මස 1 වන දින සිට බලපවත්වන පරිදි බලාත්මක වී ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

2006 අංක 13 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

**2.** (මෙහි මින්මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ—

(අ) (ආ) වන ඡේදයේ "ඒ තැනැත්තාගේ හෝ හවුල් ව්‍යාපාරයේ පිරිවැය, රක්ෂණ, නැව් ගාස්තු මත" යන වචන වෙනුවට "ඒ තැනැත්තාගේ හෝ හවුල් ව්‍යාපාරයේ පිරිවැය, රක්ෂණ, නැව් ගාස්තු මත මේ සංශෝධන පනත ක්‍රියාත්මක වීමට පෙරාතුව" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) (ඇ) වන ඡේදයේ "මේ පනත ක්‍රියාත්මක වන දින හෝ ඉන් පසුව" යන වචන වෙනුවට "2018 ඔක්තෝබර් මස 4 වැනි දින හෝ එදිනට පසු, එහෙත් මේ සංශෝධන පනත ක්‍රියාත්මක වන දිනට පෙරාතුව" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ඇ) (ඇ) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:—

"(ඈ) මේ සංශෝධන පනත ක්‍රියාත්මක වන දින හෝ ඉන්පසුව අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් භාණ්ඩ හෝ බඩු හැර සෑම ආනයන භාණ්ඩ හෝ බඩු තොගයක් සම්බන්ධයෙන් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සහතික කරන ලද මුළු පිරිවැය, රක්ෂණ සහ නැව් (CIF) ගාස්තු (235 වන අධිකාරය වූ) රේගු ආඥා පනත යටතේ ගෙවිය යුතු යම් රේගු ආනයන බදු මුදලක්, 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ අය බදු, විශේෂ වෙළෙඳ භාණ්ඩ අය බද්ද 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ ගෙවිය යුතු නිෂ්පාදන බද්ද, 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ ගෙවිය යුතු සෙස් බද්ද සහ 2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපොළ සංවර්ධන බදු පනත යටතේ ගෙවිය යුතු වරාය සහ ගුවන් තොටුපොළ සංවර්ධන අය බද්ද යන්නෙහි එකතුව,"

(ඇ) එම උපවගන්තියේ අතුරු විධානයේ ''එහෙත් 2016 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව'' යන වචන සහ ඉලක්කම් වෙනුවට ''එහෙත් 2016 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව සහ 2019 ඔක්තෝබර් මස 1 වන දින හෝ ඉන්පසුව'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (3) වන උපවගන්තියේ (ආ) ඡේදයේ ව්‍යතිරේකය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) (ආ) වන ඡේදයේ "පිරිවැටුමේ කොටසක් වශයෙන් සලකනු නොලැබිය යුතුය; සහ" යන වචන වෙනුවට "පිරිවැටුමේ කොටසක් වශයෙන් සලකනු නොලැබිය යුතු ය;" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) (ඇ) වන ඡේදයේ "පිරිවැටුමේ කොටසක් වශයෙන් සලකනු නොලැබිය යුතු ය." යන වචන වෙනුවට "පිරිවැටුමේ කොටසක් වශයෙන් සලකනු නොලැබිය යුතු ය; සහ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ඇ) (ඇ) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:—

"(ඈ) තේ නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරය කරගෙන යන තේ කර්මාන්ත ශාලා හිමිකරුවකු සම්බන්ධයෙන් වන විට, අමු තේ දලු සපයන කුඩා තේ වතු හිමියන් වෙත ගෙවන ලද තේ කර්මාන්ත ශාලාවෙහි නිෂ්පාදනය කරනු ලබන තේ විකිණීමෙන් ලත් මුදල එම තේ කර්මාන්ත ශාලා අයිතිකරුගේ පිරිවැටුමේ කොටසක් වශයෙන් සලකනු නොලැබිය යුතු ය.".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.**

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියේ (4) වන උපවගන්තිය පහත පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (අ) වන ඡේදය (ii) වන උපඡේදයේ "2014 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් අදාළ කාර්තුවක්" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2014 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව එහෙත් 2018 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන අදාළ කාර්තුවක්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) එම උපවගන්තියේ (ආ) ඡේදයේ "අවුරුදු හතරක කාලයක් ගතවීමෙන් පසුව,", යන වචන වෙනුවට "අවුරුදු හතරක කාලයක් ගතවීමෙන් පසුව;" යන වචන ආදේශ කිරීමෙන්;

(3) එම උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:—

"(ඇ) 7 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් දිනවල දී හෝ එදිනට පෙර යම් තක්සේරු වර්ෂයක යම් අදාළ කාර්තුවක් සඳහා වාර්තාවක් ඉදිරිපත් කර ඇති යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ඔහුගේ හෝ එහි ආදායම් වාර්තාව 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 93 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කර ඇත්නම්, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 135 වන වගන්තියේ (3) වන උපවගන්තියට යටත්ව, එම අදාළ කාර්තුව 2018 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් අදාළ කාර්තුවක් වන අවස්ථාවක දී එම අදාළ කාර්තුව ඇතුළත් වන තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම වූ තක්සේරු වර්ෂයේ නොවැම්බර් මස තිස් වන දින සිට මාස තිහක් ගතවීමෙන් පසුව;

(ඈ) (ඇ) වන ඡේදයේ සඳහන් දිනයේ දී හෝ එම දිනයට පෙර වාර්තාවක් ඉදිරිපත් කිරීමට ඔහු හෝ එය විසින් අපොහොසත් වන අවස්ථාවක දී, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 133 වන හෝ 134 වන වගන්තිය ප්‍රකාරව තක්සේරුව පිළිබඳ දැන්වීම බදු ගෙවන්නා වෙත ඉදිරිපත් කරන ලද දින සිට (2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 135 වන වගන්තියේ (3) වන උපවගන්තියට යටත්ව) මාස තිහක් ගතවීමෙන් පසුව,".

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තිය, එහි (1) වන උපවගන්තිය ලෙස නැවත අංකනය කිරීමෙන්;

(2) නැවත අංකනය කරන ලද (1) වන උපවගන්තියෙහි දේශීය ආදායම් පනතේ XXIII, XXIV, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX සහ XXXI වන පරිච්ඡේදවල

විධිවිධාන,'' යන වචන සහ ඉලක්කම් වෙනුවට ''2018 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව වන අදාළ කාර්තුව හෝ තක්සේරු වර්ෂය සඳහා 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ XXIII, XXIV, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX සහ XXXI වන පරිච්ඡේදවල විධිවිධාන,'' වන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:—

''(2) 2018 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන්නා වූ අදාළ තක්සේරු වර්ෂය සඳහා, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ IX, X, XII, XIII, XIV, XVI, XVII, XVIII, XIX, සහ XX වන පරිච්ඡේදවල පිළිවෙළින් විධිවිධාන, වාර්තා තබා ගැනීම සහ තොරතුරු රැස් කිරීම, තක්සේරු කිරීම්, විරෝධතා සහ අභියාචනා, බදු සඳහා බැඳීම සහ බදු ගෙවීම, බදු අය කර ගැනීම, දණ්ඩන, අපරාධ නඩු කටයුතු, නියෝග සහ අර්ථ නිරූපණයට අදාළ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව මේ පනත යටතේ පිළිවෙළින් පරිපාලන විධිවිධාන, වාර්තා, තබා ගැනීම සහ තොරතුරු රැස් කිරීම, තක්සේරු කිරීම්, විරෝධතා සහ අභියාචනා, බදු සඳහා බැඳීම සහ බදු ගෙවීම, පොලිය, බදු අය කර ගැනීම, දණ්ඩන, අපරාධ නඩු කටයුතු, නියෝග සහ අර්ථ නිරූපණය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.''.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ''බෙදාහරින්නා'' යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් :—

'''බෙදාහරින්නා'' යන්නෙන්, ශ්‍රී ලංකාවේ යම් භාණ්ඩ නිෂ්පාදකයකු හෝ සාදන්නකු හෝ ආනයනකරුවකුට අදාළ ව කලින් කල එම නිෂ්පාදකයා හෝ නිපදවන්නා හෝ බෙදාහරින්නා

විසින් තීරණය කරනු ලබන මිල ගණන් යටතේ එකී භාණ්ඩ තොග වශයෙන් වෙළෙඳපොළේ විකිණීම සඳහා, එම නිෂ්පාදකවරයා හෝ සාදන්නා හෝ ආනයනකරු විසින් පත් කරන ලද යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් අදහස් වේ;'' සහ

(2) ''දේශීය ආදායම් පනත'' යන යෙදුමේ අර්ථ නිරූපණ ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණ ආදේශ කිරීමෙන් :—

'''දේශීය ආදායම් පනත'' යන්නෙන්, අවස්ථාවෝචිත පරිදි, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත හෝ ආදායම් බදු අයකිරීම සඳහා විධිවිධාන සලස්වනු ලබන එහි යම් අනුප්‍රාප්තිකයකු අදහස් වේ;''.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**6.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.